

# කෘත්‍රීම හදවතක්

උග්‍ර හදවත් රෝගීන්ට මිනිස් හෘදයක් බද්ධ කිරීමේ අවස්ථාව උදාවනතුරු ජීවත් වීමේ වාසනාව උදාකර දෙන නවතම විකල්පය "පොලියුරිතීන්" හදවතයි. මෙම හදවත ශල්‍යකර්මයක් මඟින් බද්ධ කිරීමේ දී එයට සම්බන්ධිත ප්ලාස්ටික් නාල රෝගියාගේ සම හරහා බැටරි බලයෙන් ක්‍රියාකරන වායුමය පොම්පයකට සම්බන්ධ කෙරේ. ඇමරිකානු ඩොලර් 106 000 ක් වූ මෙවන් හදවතක වටිනාකම නොසලකා අද එයට ඇති ඉල්ලුම බලවත් වී තිබේ.

ඇමරිකා එ.ජනපදයේ පමණක් 3,000 ක් පමණ දෙනා හදවත් බද්ධ කිරීම සඳහා මඟ බලා සිටිය ද වසරකට ලබාගත හැකි වී ඇත්තේ දායක මිනිස් හදවත් 2,100 පමණ සංඛ්‍යාවකි.

කෘත්‍රීම හදවත් සැපයුම වැඩි දියුණු වීම, සාපේක්ෂව ගත් කළ සියුම් තාක්ෂණික පිම්මක් බවට පත්වෙද්දී මිනිස් හදවත් සැපයුම ඉහළ යෑම වඩාත් අභියෝගයට ලක්ව තිබේ. හෙට දිනයේ හදවත් දායකයෝ වනු ඇත්තේ කවරහු ද ? මෙහි ඡායාරූප මඟින් දැක්වෙන ආකාරයේ කෘත්‍රීම හදවත් බද්ධයට ලක් වූ රෝගීන් ගේ හදවතේ කැකෑරෙන ගැටලුව එයයි.














Siegfried Streiter ගේ කෘත්‍රිම හදවත තාවකාලිකව සම්බන්ධ කර තිබේ. එහෙත්, වෛද්‍යවරු බරපතල වූ ඉදිරි පියවර සඳහා නොනවත්වා වෙහෙසෙමින් සිටිති. අවසානයේ සාර්ථකව බද්ධිත යාන්ත්‍රික හදවතට, බාහිර නාල පොම්ප හෝ බැටරි අනවශ්‍ය වන අතරම, කිසිදු ඉවත් කිරීමට ද සිදු නොවනු ඇත.



# කෘත්‍රිම හදවත් බද්ධය

ජර්මනියේ බර්ලින් හෘද ආයතනයේ දී හැට දෙහැවිරිදි Siegfried Streiter කෘත්‍රිම හදවතක් බද්ධ කිරීමේ ශල්‍යකර්මයට භාජනය කෙරිණි. මෙහි දී ප්‍රථම කැපුමේ සිට අවසාන මැහුම දක්වා පැය හතරක කාලයක් ගත වී තිබිණි.
ශල්‍යකර්මය සඳහා සහභාගි වූ ප්‍රධාන ශල්‍ය වෛද්‍ය රෝලන්ඩ් හෙට්සර් පවසන අන්දමට, "මෙම ක්‍රමය මඟින් රෝගියාව ජීවත්කරවනව පමණක් නොවෙයි, එය ශක්තිමත් ඒ වගේම අනවරත නාඩි වැටීම මඟින් එම පුද්ගලයාගේ පෙනහලු නාලවල පවතින නිදන්ගත අවහිරතා නිරවුල් කිරීමටත් මෙය උපකාරී වනවා."වෛද්‍ය හෙට්සර් ගේ අදහස වන්නේ, මේ අනුව දයක මිනිස් හදවත් බද්ධය වැඩි කල් නොගොස්ම බිඳ වැටිය හැකි බවයි.

නැෂනල් ජියොගැෆික් ඇසුරෙනි
ලලනි

# කෘත්‍රිම හදවත් බද්ධයෙන් හාර මසකට පසු

Siegfried Streiter නිරතුරු ඇවිදීමට යන අතර, ඒ හදවතේ ගැස්ම රඳවා ගන්නා උපකරණය ද පසෙක සහිතවය. කිසියම් කාල සීමාවකට වරක් උපකරණයෙන් "බීප්" ශබ්දයක් නැඟුන ද, ඔහු ඒ පිළිබඳ පැමිණිලි කරන්නෙ නැත. "හොඳම ආරංචිය මම ජීවත්වෙන එකයි" ඔහු පවසයි.